# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## පුරප්පාඩු

## නියෝජ්‍ය සම්බන්ධීකරණ ඉංජිනේරු තනතුර

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින 'නියෝජ්‍ය සම්බන්ධීකරණ ඉංජිනේරු' තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමග 2026 මැයි මස 04 දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තමන් අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය).

**1.** වැටුප් පරිමාණය :-

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය

**රු. 109,090 – 7 x 2940 / 6 x 3900 – රු. 153,070/- වේ.** (විධායක දීමනාව සහ අනෙකුත් අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 212,000 /- ක් පමණ වේ.)

(ඉහත සඳහන් චක්‍රලේඛයට අනුව 2027 සඳහා තවදුරටත් වැටුප් සංශෝධනය සිදු කිරීමට නියමිතයි).

**2.** වයස් සීමාව :-

අයදුම්පත භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා ඉහත උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**3.** අධ්‍යාපන සුදුසුකම්:-

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක ඉංජිනේරු විද්‍යාවේදී (විදුලි/ ඉලෙක්ට්‍රොනික්/ සිවිල්) උපාධිධාරියෙකු වීම.

**4.** වෘත්තීය සුදුසුකම් :-

2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ පනතට අනුව ස්ථාපිත පිළිගත් ඉංජිනේරු ආයතනයක වරලත් ඉංජිනේරු සාමාජිකත්වය ලබා තිබීම.

**5.** පළපුරුද්ද:-

ඉහත (4) හි දක්වා ඇති වෘත්තීය සුදුසුකම ලබා ගැනීමෙන් පසු, විදුලි/ ඉලෙක්ට්‍රොනික්/ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයක අවම වශයෙන් වසරක පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

- ගොඩනැගිලි නඩත්තු ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**6.** බඳවා ගැනීමේ ක්‍රමය :-

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**7.** සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමේ නිර්ණායක :-

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

අවශ්‍ය මූලික සුදුසුකම් සපුරන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. ඒ සඳහා වෙන්කර ඇති මුළු ලකුණු සංඛ්‍යාව සියයකි (100):-

| *අනු අංකය* | *නිර්ණායක* |
|---|---|
| 1 | අමතර අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | සේවා පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

**8.** සේවා නියමයන් සහ කොන්දේසි

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබයි. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක, සේවය ස්ථිර කරනු ලැබූ අයදුම්කරුවකු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක (01) වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) පත්වීම ක්‍රියාත්මක වන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබේ. මෙම පුරප්පාඩුව නොපිරවීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට බලය ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරු පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iv) තෝරාගනු ලබන අයදුම්කරු, වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ඔහුගේ/ ඇයගේ වැටුපෙන් රජය විසින් තීරණය කරනු ලබන ප්‍රතිශතයකින් දායකත්වය ලබා දිය යුතු ය.

(v) තෝරාගනු ලබන අයදුම්කරු වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

(vi) තෝරාගනු ලබන අයදුම්කරු පත්කිරීමට පෙර ඔහු/ ඇය පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තාවක් ලබා ගැනීම සිදු කරනු ඇත.

**9.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් සිය අයදුම්පතට (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

i. උප්පැන්න සහතිකය;
ii. ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්;
iii. අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
iv. වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
v. පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

10. රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

11. තනතුර ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

12. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ සාවද්‍ය යැයි යමෙකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

13. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන (දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) හෝ ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙළ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

කුෂානි රෝහණදීර,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
2026 අප්‍රේල් මස 09 දින.